# 9. සමාජ ආරක්‍ෂණ වැඩසටහන්

## සමෘද්ධි වැඩසටහන

*1995 දී ආරම්භ කරන ලද සමෘද්ධි වැඩසටහන පවුල් 2,013,685 ක් ආවරණය වන පරිදි වසර 2000 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන මගින් මූල්‍ය දීමනා සැපයීම, සමාජ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සහ සමෘද්ධි බැංකු කටයුතු වැඩිදියුණු කිරීම මගින් සමාජයේ පහළම මට්ටමේ ඉතිරිකිරීම් හා ආයෝජන දිරිමත් කිරීම් කරනු ලබයි.*

- ▲ 1999 දී රුපියල් දශ ලක්‍ෂ 8,175 ක් වූ සමෘද්ධි අතිරේක ආදායම් වැඩසටහන සඳහා වූ මුළු වියදම සමග සසඳ බලන විට 2000 වර්ෂයේ වියදම රුපියල් දශ ලක්‍ෂ 12,355 ක් විය. මෙම වියදම් ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතුව වූයේ වසර 2000 අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි සමෘද්ධි දීමනාව සියයට 40-150 අතර ප්‍රමාණයකින් ඉහළ දැමීමය.
- ▲ වියලි සලාක ලබන අවතැන් වූ පවුල් සංඛ්‍යාව 150,108 ක් විය. වසර 2000 දී වියලි සලාක වැඩසටහන සඳහා වූ වියදම රුපියල් දශ ලක්‍ෂ 1,829 ක් විය.
- ▲ පෝෂණ වැඩසටහන සඳහා රුපියල් දශ ලක්‍ෂ 138 ක් වියදම් කර ඇත.
- ▲ වසර 2000 අවසන් වනවිට සේවයෙහි නිරතව සිටි මුළු සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංඛ්‍යාව 22,468 ක් විය.
- ▲ සමෘද්ධි ජනතා ව්‍යාපෘති යටතේ සුළු පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 1,123 ක් සඳහා රුපියල් දශ ලක්‍ෂ 140 ක මුදලක් වෙන් කරන ලදී.
- ▲ සමෘද්ධි සමාජ සංරක්‍ෂණ ක්‍රමය යටතේ කරන ලද ඉල්ලීම් 85,431 ක් සඳහා රුපියල් දශ ලක්‍ෂ 171 ක් ගෙවන ලදී.
- ▲ වසර 2000 අවසාන වනවිට සමෘද්ධි බැංකු සංගම් 920 ක් ක්‍රියාත්මකව පැවතුනි.
- ▲ වසර 2000 අවසන් වනවිට සමෘද්ධි අනිවාර්ය ඉතිරි කිරීම් ක්‍රමය යටතේ රුපියල් දශ ලක්‍ෂ 6,329 ක් ඉතිරිකර තිබූ අතර, ස්වේච්ඡා ඉතිරිකිරීම් ක්‍රමය යටතේ රුපියල් දශ ලක්‍ෂ 735 ක් ඉතිරි කර තිබුණි.

සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව




9.1 රූපසටහන

සමෘද්ධි සුභසාධන පිරිවැය




9.2 රූපසටහන